# දියමන්ති ව්‍යාපෘතිය

## ඉතිහාසය - 10 ශ්‍රේණිය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියෙහි අදහස, ඉලක්ක හා ක්‍රියාවලිය

'' නිපුණතා පාදක අධ්‍යාපනික ප්‍රවේශය" තුළින් වත්මන් ශ්‍රී ලාංකේය දරු පරපුර තුළ අර්ථවත් ඉගෙනුමක් මත පරිපූර්ණ ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, හුරුපුරුදු රෝපණය කොට ඒවා වර්ධනය කර ගැනීමට මඟපෙන්වීම් සිදු කර ඇත. පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අපේක්ෂාව වනුයේ සක්‍රීය මෙන්ම ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් තුළ අත්දැකීම් ලබා ගැනීමට මඟපෙන්වීමත් ඒ මඟින් නිපුණතා පූර්ණ සමබර පෞරුෂයක් ඇති පුද්ගලයෙකු සමාජයට හිමිකර දීමත්ය. එහි අවසන් ඵලය වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයට යොදවන යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව, ඵලදායි නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගෝලීය ප්‍රවණතාවයට සරිලන පරපුරක් බිහි කිරීමත්ය.

එබැවින් සෑම පාසලක ම, සෑම ගුරුභවතෙකු විසින් ම සෑම දරුවෙකුට ම සමාන ඉලක්ක සහිතව ඉගැන්වීම, පාඩම් සැලසුම් කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව නිරත කරවීම, පන්ති කාමර ඇගයීම් හා තක්සේරුකරණය ඵලදායී ලෙෂ යොදා ගැනීම හා කාලය සඵලදායි ලෙෂ කලමනාකරණය කර ගැනීමට අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ''දියමන්ති ව්‍යාපෘතිය" හඳුන්වා දී ඇත.

සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් හා ගුණාත්මක යෙදවුම් තෝරා ගැනීමට ගුරුභවතුන්ට අත්‍යවශ්‍ය මඟපෙන්වීම පමණක් මෙමගින් ලබා දී තිබේ. ගුරුවරයා තම නිර්මාණාත්මක හැකියාව මත විධිමත්ව ඉලක්ක වෙත ළඟාවිය යුතුය. මෙමගින් නව ලොවට උචිත නිපුණතා පූර්ණ පුරවැසියන් බිහි කිරීම හා එයට ගැලපෙන ගුරු භූමිකාවක් හා ක්‍රියාශීලී පන්ති කාමරයක් සහිත ඉගෙනුම් සංස්කෘතියක් නිදහස් අධ්‍යාපනයට දායාද කිරීම අපගේ අපේක්ෂාවයි.

එස්. කුරුප්පු ආරච්චි
සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# දියමන්ති ව්‍යාපෘතියෙහි ප්‍රයෝජන

❖ **මෙම ලේඛන භාවිතා කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළුම කණ්ඩායම් මතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කර දරුවන්ට ඉගෙනුම් අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට ක්‍රියා කළ යුතුය.**

1. ගුරුභවතුන් විසින් සෑම ඒකකයක්ම නියමිත කාල වකවානු තුළ නිම කිරීම.
2. ඊට අදාල ඉලක්ක, පැවරුම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ඇගයීම් ලබා දීම.
3. මෙම ඉලක්ක පිළිබඳව දරුවන්, දෙමව්පියන් ආදී සියලුම පාර්ශව දැනුවත් කිරීම. ( ටියුෂන් ගුරුවරු ද මෙම ඉලක්ක අනුගමනය කිරීම ඵලදායි වේ.)
4. පළාතේ සියලුම ඇගයීම් හා වාර පරීක්ෂණ මෙම ඉලක්ක මත ප්‍රමිතිගතව නිර්මාණය කිරීම.
5. විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන යන අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම් ද, ගුරු උපදේශක, විෂය අධ්‍යක්ෂවරු ආදී සියළුම බාහිර අධීක්ෂක කණ්ඩායම් ද මෙම ඉලක්ක අනුව කටයුතු කිරීම.
6. සියලුම අධීක්ෂණ වර්තා මඟින් මෙම ඉලක්ක ළඟාකර ගෙන ඇති ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වයන් තක්සේරු කිරීම.
7. ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය මැනීමේ දී මෙම ඇගයීම් වාර්තා මත කටයුතු කිරීම.

❖ තම විෂයයට අදාල කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුවරයාට ද, විෂයයකට අදාලව උපරිම ඉගෙනුම් කාලයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ද අධීක්ෂණය හා නියාමනය සඳහා අභ්‍යන්තරව හා බාහිර අධීක්ෂකවරයාට ද, පාසල තුළ විෂය මාලාව නිසි ලෙස කළමනාකරණය පිණිස විදුහලිපතිවරයාට ද, ඇගයීම් ප්‍රමිතිගතව සංවිධානය සඳහා අදාල කණ්ඩායම් වලට ද, දරුවා යන ගමන් මඟ සහ පාසලේ ක්‍රියාවලිය නිසි ලෙස දැකීම දෙමව්පියන්ට ද, පාසලට හා දරුවාට සහාය දීම පිණිස විවිධ බාහිර පාර්ශවයන්ට ද, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කළමනාකරුවන් හා පරිපාලකයන්ට ද මූල්‍ය ප්‍රගතිය හා ඵලය මැනීම සඳහා විගණන නිලධාරයාට මෙම ලේඛනය අතිශය ඵලදායී වේ.

# සමාජයීය විද්‍යා විෂයන් දියමන්ති ව්‍යාපෘතියට . . .

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළාතට අයිති ග්‍රාමීය නාගරික, ලොකු කුඩා, ජනප්‍රිය හා ජනප්‍රිය නොවන සෑම පාසලක් තුළම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, අභ්‍යන්තර/ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියත්, සම්භවන/සම්පින්ඩිත ඇගයීම් ක්‍රියාවලියත්, නිෂ්චිත දින වකවානු, නිෂ්චිත ක්‍රමවේද හා නිෂ්චිත ප්‍රමිති සහිත ව ක්‍රියාත්මක කිරීම මගින් සෑම දරුවකු සඳහා ම සමාන ඉගෙනුම් අවස්ථා සම්පාදනයත්, අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයත් ඉලක්ක කොටගෙන දියමන්ති ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මේ අනුව පළාතේ සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන්ගේත්, විෂය ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන්ගේත් සම්පත්දායකත්වය ලබා ගෙන සකස් කරනු ලැබූ ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය විෂයයන්ට අයත් අධ්‍යයන ඉලක්ක, ආදර්ශ ඇගයීම් ආකෘති, ආදර්ශ ඉගෙනුම් ආධාරක ආදිය අනුගමනය කිරීම, සැලසුම් සහගත අධ්‍යයන ක්‍රියාවලියකට මග පාදයි. තවද ගුරුවරයාගේ කාලය මනා ලෙස කළමනාකරණයට මග පාදයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘණාත්මකව බලපෑමක් කරන, පාඩමට පූර්ව සූදානම සම්බන්ධව ඇතැම් ගුරුවරුන්ගේ තිබෙන ගැටළුත්, ඒකාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් හේතුවෙන් බහුවිධ හැකියාවන්ගෙන් යුත් දරුවන්ට සිදුවන අවාසිදායක තත්ත්වයනුත් මෙතුළින් නිවැරදි කරගත හැකිය.

මෙහි දී විශේෂයෙන් ම අවධාරණය කළ යුතු කාරණාවක් වන්නේ දියමන්ති ව්‍යාපෘතිය දෙවන අදියර කොටසේ දී අප විසින් ඉදිරිපත් කරන ආකෘතිය ගුරුවරයාට කරන මග පෙන්වීමක් පමණක් වන අතර විෂය උගන්වන ගුරුවරයාගේ දැනුම අත්දැකීම් හා හැකියාවන් මත මෙම මගපෙන්වීම ඔස්සේ විෂය මාලාව නිර්මාණශීලීව සකස් කර ගත හැකිය. ආකෘතියකින් අප ඉදිරිපත් කරන ආදර්ශ ක්‍රමවේදයන්ට සීමා වීම අපේක්ෂා නොකෙරේ. සමාජීයය විද්‍යා විෂයයන්ට අදාළ ගුරු මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණශීලී ඉගෙනුම් අත්දැකීමක් වෙත සිසුන් යොමු කිරීමෙන් මෙහි ඇති ඉලක්ක වෙත වඩාත් සඵලදායි ලෙස ළඟාවීම ගුරුවරයා සතු වගකීම වේ.

ඒ අනුව මෙහි සඳහන් දින වකවානු අනුව ම, පාඩම් ඒකක අවසන් කර අදාළ ඇගයීම්වලට සිසුන් යොමු කිරීම අපේක්ෂා කරන අතර මෙය අප පළාතේ දරුවන් සමබර පෞරුෂයකින් යුක්ත ව සමාජයට දායාද කිරීමට ඔබ දක්වන මාහැඟි දායකත්වයට අත්වැලක් වනු ඇත.

ජේ. ඒ. ඩී. මාලින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යාව)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**
**10 ශ්‍රේණිය**
**පළමු වාරය**

**ඉතිහාසය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **10** | 10.1 ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය | 10.1.1 මූලාශ්‍ර වර්ගීකරණය<br>ඉතිහාසය ඉගෙන ගැනීමේ වැදගත්කම | ජනවාරි 08<br>ජනවාරි 16 | 02<br>02 | පැය 01 වි. 20<br>පැය 01 වි. 20 | |
| | 10.2 ශ්‍රී ලංකාවේ ජනාවාස | 10.2.1 ප්‍රාග් ඓතිහාසික යුගය | ජනවාරි 19 | 02 | පැය 01 වි. 20 | |
| | | 10.2.2 පූර්ව ඓතිහාසික යුගය | ජනවාරි 22 | 02 | පැය 01 වි. 20 | |
| | | 10.2.3 ඓතිහාසික යුගය | ජනවාරි 26 | 02 | පැය 01 වි. 20 | |
| | 10.3 ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම. | 10.3.1 පූර්ව රාජ්‍ය සමය | පෙබරවාරි 01 | 03 | පැය 02 | |
| | | 10.3.2 රාජ්‍යත්වයේ වර්ධනය | පෙබරවාරි 08 | 03 | පැය 02 | |
| | | 10.3.3 රාජ්‍යත්වය හා රජු පිළිබඳ විස්තර කිරීම | පෙබරවාරි 15 | 03 | පැය 02 | |
| | | 10.3.4 දේශයට සේවය කළ රජවරු | පෙබරවාරි 23 | 03 | පැය 02 | |
| | 10.4 ශ්‍රී ලංකාවේ පැරණි සමාජය | 10.4.1 පාලනය | මාර්තු 05 | 03 | පැය 02 | |
| | | 10.4.2 ආර්ථිකය | මාර්තු 16 | 04 | පැය 02 වි. 40 | |
| | | 10.4.3 සංස්කෘතිය | මැයි 09 | 05 | පැය 03 වි. 20 | |
| | 10.5 ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්ෂණය | 10.5.1 ව්‍යවහාරික විද්‍යාවේ මුල් අවස්ථා | මැයි 16 | 02 | පැය 01 වි. 20 | |
| **දෙවන වාරය** | | | | | | |
| | | 10.5.2 විද්‍යාත්මක භාවිතයේ පරිනතිය | ජුනි 26 | 16 | පැය 06 වි. 40 | |
| | 10.6 ඓතිහාසික දැනුම හා එහි ප්‍රායෝගික ආදේශනය | 10.6.1 ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය | ජුලි 26 | 02 | පැය 01 වි. 20 | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | 10.6.2 නීතිය හා සම්ප්‍රදාය<br>මුදල් හා විනිමය | ජූලි 05 | 02 | පැය 01 වි. 40<br>පැය 01 වි. 40 | |
| | | 10.6.3 කාන්තා නියෝජනය<br>දේශීය ආහාර<br>පරිසරය ආරක්ෂා කර ගැනීම | ජූලි 13<br><br>සැප්තැම්බර් 11 | 02<br>02<br>02 | පැය 01 වි. 20<br>පැය 01 වි. 20<br>පැය 01 වි. 20 | |
| **තෙවන වාරය** | | | | | | |
| | 10.7 වියලි කලාපයේ පැරණි නගර බිඳවැටීම | 10.7.1 වියළි කලාපයේ පැරණි නගර බිඳවැටීම | සැප්තැම්බර් 14 | 01 | වි. 40 | |
| | | 10.7.2 දෙවන නාගරිකරණ සමයේ රටේ ස්ථාවරත්වය ගොඩනඟා ගත් පාලකයෝ | සැප්තැම්බර් 17 | 02 | පැය 01 වි. 20 | |
| | | 10.7.3 දෙවන නාගරිකරණයේ ආර්ථික රටාව හා ආගම | සැප්තැම්බර් 23 | 02 | | |
| | | 10.7.4 දෙවන නාගරිකරණ සමයේ සාහිත්‍ය | සැප්තැම්බර් 28 | 01 | | |
| | 10.8 මහනුවර රාජධානිය | 10.8.1 මහනුවර රාජධානියේ ආරම්භය හා ව්‍යාප්තිය | ඔක්තෝම්බර් 07 | 04 | | |
| | | 10.8.2 මහනුවර පරිපාලන ක්‍රමවේදය | ඔක්තෝම්බර් 12 | 04 | | |
| | | 10.8.3 මහනුවර ජන ජීවිතය | ඔක්තෝම්බර් 19 | 02 | | |
| | 10.9 යුරෝපයේ පුනරුදය | 10.9.1 පුනරුදය විමර්ශනය කරයි | ඔක්තෝම්බර් 25 | 04 | පැය 02 වි. 40 | |
| | | 10.9.2 පුනරුදය ලංකාවට කල බලපෑම | නොවැම්බර් 02 | 02 | පැය 01 වි. 20 | |
| | 10.10 ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය | 10.10.1 පෘතුගීසීන් ආසියාවට පැමිණීම | නොවැම්බර් 04 | 01 | වි. 40 | |
| | | 10.10.2 පෘතුගීසීන් පැමිණි අවධියේ ලංකාවේ දේශපාලන තත්ත්වය | නොවැම්බර් 11 | 03 | පැය 02 | |
| | | 10.10.3 ශ්‍රී ලංකාව හා ලන්දේසීන් | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
# (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**10 ශ්‍රේණිය**

**ඉතිහාසය**

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.1.1 මූලාශ්‍ර වර්ගීකරණය ඉතිහාසය ඉගෙන ගැනීමේ වැදගත්කම | • ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය පිළිබඳ අත්පොතක් සෑදීමට යොමුකරවීම. | පෙළ පොත<br>ක්‍රියාකාරකම 01<br>ක්‍රියාකාරකම 02 | • සංකල්ප සිතියම්<br>• බුද්ධි කලම්භනය | • විවිධ සාහිත්‍ය මූලාශ්‍රය<br>• ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම පිළිබඳ රචිත පොත්පත්<br>• ගුරු අත්පොත<br>• පෙළ පොත | • දේශීය සාහිත්‍ය මූලාශ්‍රය<br>- මහාවංශය<br>- රාජාවලිය<br>• විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය<br>- රොබට් නොක්ස්ගේ එදා හෙළදිව<br>• කෞතුකාගාරය නිරීක්ෂණය | පුස්තකාලය ඇසුරෙන් සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ අධ්‍යයනයට යොමු කරවීම. |
| 10.2.1 ප්‍රාග් ඓතිහාසික යුගය | • ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක් සකස් කරවීම. | ප්‍රාග් ඓතිහාසික යුගය<br>- හැඳින්වීම<br>- ස්වරූපය<br>- ජීවන රටාව<br>- ආහාර රටාව<br>- තාක්ෂණය<br>- අභිචාර විධි | • ක්ෂේත්‍ර චාරිකා<br>• ගවේෂණ<br>• නිරීක්ෂණ | • වීඩියෝ පට<br>• විවිධ ඡායාරූප<br>• ප්‍රාග්/පූර්ව/ඓතිහාසික යුග පිළිබඳ රචනා වූ පොත්පත්<br>• ප්‍රාග්/පූර්ව/ඓතිහාසික යුගවල ජනාවාස සිතියම්<br>• ගුරු අත්පොත<br>• පෙළ පොත | • ප්‍රාග්/පූර්ව/ ඓතිහාසික යුග පිළිබඳ රචිත ග්‍රන්ථ<br>• ප්‍රාග් ඓතිහාසික ස්ථාන නිරීක්ෂණය | • ප්‍රාග්/ පූර්ව/ ඓතිහාසික යුග වලට වැදගත් දෑ ද්‍රව්‍ය හා පින්තූර ලෙස රැස් කරවීම. |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.2.2 පූර්ව ඓතිහාසික යුගය | • පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක් සකස් කරවීම. | පූර්ව ඓතිහාසික යුගය<br>- හැඳින්වීම<br>- ගොඩනැඟීමට හේතු<br>- ජනාවාස ස්වභාවය<br>- ජීවන රටාව<br>- තාක්ෂණය | | • ප්‍රාග්/ පූර්ව/ ඓතිහාසික යුගවල ජනාවාස සිතියම්<br>• ගුරු අත්පොත<br>• පෙළ පොත | • පූර්ව ඓතිහාසික යුගයේ වැදගත් ස්ථාන නිරීක්ෂණය | |
| 10.2.3 ඓතිහාසික යුගය | • ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක් සකස් කරවීම. | ඓතිහාසික යුගය<br>- හැඳින්වීම<br>- ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක<br>- ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය<br>- ජනාවාස වර්ග<br>- යැපුම් ක්‍රමය<br>- තාක්ෂණය<br>- මුහුණ දුන් අභියෝග ආදිය ඇතුළත් සඟරාවක් සැකසීම. | | • ගුරු අත්පොත පිටු අංක 01 ඇමුණුම් 01/02 | • ඓතිහාසික යුගයේ වැදගත් ස්ථාන නිරීක්ෂණය | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.3.1 පූර්ව රාජ්‍ය සමය | • මුල් යුගයේ රජවරු පිළිබඳ කෙටි ප්‍රශ්නෝත්තර පොතක් සකස් කරවීම. | • ව්‍යුහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරවීම.<br>උදා :- ගුරු අත්පොත 11 පිටුව | • සාකච්ඡා ක්‍රමය<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• චරිතාරෝපිත කතා<br>• සංවාද | • අදාළ විවිධ පොත්පත්<br>• ප්‍රදර්ශන පුවරු<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්<br>• ගුරු අත්පොත<br>• පෙළ පොත | • අනුරාධපුර පොළොන්නරුව යුගවල දේශපාලනය පිළිබඳ ලියවුණු පොත්පත් | • අනුරාධපුර පොළොන්නරුව මාගම රාජධානිවල ක්ෂේත්‍ර අධ්‍යයනය චාරිකා<br>• වීඩියෝ පට |
| 10.3.2 රාජ්‍යත්වයේ වර්ධනය | • පූර්ව රාජ්‍ය සමය<br>- ගෘහපති<br>- ගමික<br>- පරුමක බිහිවීම<br>• රාජ්‍යත්ව වර්ධනය<br>- පරුමක රජවීම | | | | | |

<table>
<tr><th>අනු ඒකකය</th><th>ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්</th><th>ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න</th><th>ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද</th><th>ඉගෙනුම් ආධාරක</th><th>අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම්</th><th>ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම</th></tr>
<tr><td>10.3.3 රාජ්‍යත්වය හා රජු පිළිබඳ විස්තර කිරීම</td><td>• රාජ්‍යයත්ව සංකල්ප බිහිවීම.<br>• රාජ්‍ය උරුමය ලැබීම<br>• මුල් කාලීන රාජ්‍යතන්ත්‍රය පිළිබඳ</td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>10.3.4 දේශයට සේවය කළ රජවරු</td><td>• ප්‍රදර්ශන පුවරු සැකසීම</td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>10.4.1 පාලනය</td><td>• විධායකය<br>• ව්‍යවස්ථාදායකය<br>• අධිකරණය<br>• විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ වගු සටහනක් සකස් කරවීම.<table><tr><th>ආයතනය</th><th>කාර්යය</th><th>විස්තර වන මූලාශ්‍රය</th></tr><tr><td></td><td></td><td></td></tr></table></td><td>පෙළ පොත<br>ක්‍රියාකාරකම 01<br>ක්‍රියාකාරකම 02</td><td>• කණ්ඩායම් ක්‍රියා<br>• සංවාද<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• ප්‍රශ්නකරණය</td><td>• $A_4$ කොල<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ජ්ලැටිග්නම්</td><td>• රජරට ආර්ථිකය පිළිබඳ ලියවුණ පොත්පත්<br>• රජරට සමාජය පිළිබඳ ලියවුණ පොත්පත්<br>• ශාසන ඉතිහාසය පිළිබඳ ලියවුණ පොත්පත්.</td><td>• පාලනය<br>• ආර්ථිකය<br>• සංස්කෘතිය යන මාතෘකා යටතේ බිත්ති පුවත්පතකට ලිපි සැකසීමට යොමු කරවීම.</td></tr>
<tr><td>10.4.2 ආර්ථිකය</td><td>• කෘෂිකර්මාන්තය<br>• කර්මාන්ත<br>• වෙළඳාම යන අංශ ආවරණය වන පරිදි සංකල්ප සිතියමක් සකස් කිරීම.</td><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.4.3 සංස්කෘතිය | • ආගම<br>• අධ්‍යාපනය<br>• සාහිත්‍ය<br>• වාර්ගික සහජීවනය යන කරුණු ආවරණය වන සේ පැරණි සමාජය ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු පොතක් සකස් කිරීම. | | | | | |
| 10.5.1 ව්‍යවහාරික විද්‍යාවේ මුල් අවස්ථා | "ආදි මුතුන් මිත්තන්ගේ විද්‍යාත්මක දැනුම හා තාක්ෂණික කුසලතාව" මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් සැකසීමට යොමු කරවීම. | පෙළ පොත ක්‍රියාකාරකම 01 | • නිරීක්ෂණය<br>• ක්ෂේත්‍ර චාරිකා | • වීඩියෝ පට<br>• ප්‍රදර්ශන පුවරු | අපේ පැරණි තාක්ෂණය පිළිබඳ ලියවී ඇති පොත්පත් | පැරණි තාක්ෂණික උපකරණ හා පැරණි විද්‍යාත්මක නිර්මාණවල පින්තූර එකතුවක් සෑදීමට යොමු කරවීම. |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.5.2 විද්‍යාත්මක භාවිතයේ පරිනතිය | • වැවක ආකෘතියක් සැකසීම<br>• පැරණි වාස්තු විද්‍යාත්මක ක්‍රම පිළිබඳ ඉස්මතු වන ඡායාරූප එකතුවක් සැකසීම. | • ඓතිහාසික යුගයට අයත් විද්‍යාව හා තාක්ෂණයෙහි ස්වදේශීය අනන්‍යතාව අගය කරමින් නිර්මාණශීලී ව ලිපියක් සකස් කිරීමට යොමු කරවීම. | • ගවේෂණ<br>• නිරීක්ෂණ<br>• සංවාද<br>• කණ්ඩායම් ක්‍රියා | • ඡායාරූප<br>• වීඩියෝ පට<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්<br>• ගුරු අත්පොත<br>• පෙළ පොත | • ශ්‍රී ලංකාවේ වාරිමාර්ග තාක්ෂණය<br>• ස්ථූප/ ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණය ආදිය පිළිබඳ ලියවුණ පොත්පත්<br>• සීගිරියේ ජල තාක්ෂණය පිළිබඳ ලියවුණ පොත්පත්<br>• ශ්‍රී ලංකාවේ විවිධ කෙම් පහන් ක්‍රම පිළිබඳ ලියවුණ පොත්පත් | නූතන විද්‍යාත්මක සිද්ධාන්ත සමඟ පැරණි විද්‍යාත්මක ක්‍රම සංසන්දනය කිරීම. |

<table>
<tr><th>අනු ඒකකය</th><th>ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්</th><th>ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න</th><th>ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද</th><th>ඉගෙනුම් ආධාරක</th><th>අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම්</th><th>ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම</th></tr>
<tr><td>10.6.1 ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය</td><td>• සමාජ සංවිධානය ඇසුරෙන් පහත ආකෘතිය සම්පූර්ණ කරන්න.<br><br></td><td>පැරණි සමාජ සංවිධානයෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙළගස්වන්න.</td><td>• ගවේෂණ<br>• සංවාද<br>• කණ්ඩායම් ක්‍රියා<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ</td><td>• $A_4$ කොළ<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්<br>• ගුරු අත්පොත<br>• පෙළපොත</td><td>• අන්තර් ජාලය වෙනත් පොත්පත් ඇසුරෙන් විවිධ සෙල්ලිපිවල ඡායාරූප එකතුවක් සෑදීම.</td><td>මාතෘකාවේ තෝරා ගත් කොටස් සඳහා කණ්ඩායම් වෙන් කර විවිධ ඉදිරිපත් කිරීම් සිදුකිරීම.</td></tr>
<tr><td>10.6.2 නීතිය හා සම්ප්‍රදාය<br>මුදල් හා විනිමය</td><td>වගුගත කරන්න.<br><table><tr><th>සෙල්ලිපිය</th><th>අන්තර්ගතය</th><th>කරවූ රජු</th></tr><tr><td></td><td></td><td></td></tr></table>• අපේ පැරණි මුදල් වර්ගවලින් අධ්‍යයනය කළහැකි දේ.</td><td>• පැරණි නීතිය හා සම්ප්‍රදාය යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වූ ආකාරය මැයෙන් රචනයක් ලියන්න.<br>• අපේ පැරණි මුදල් වර්ගවල පින්තූර එකතුවක් සාදන්න.</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

<table>
<tr><th>අනු ඒකකය</th><th>ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්</th><th>ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න</th><th>ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද</th><th>ඉගෙනුම් ආධාරක</th><th>අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම්</th><th>ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම</th></tr>
<tr><td>10.6.3 කාන්තා නියෝජනය දේශීය ආහාර පරිසරය ආරක්ෂා කර ගැනීම</td><td>• අතීත කාන්තාවන්ගේ සමාජ වගකීම් පෙළගස්වන්න.<table><tr><th>ආහාර වර්ගය</th><th>සඳහන් මූලාශ්‍රය</th></tr><tr><td></td><td></td></tr></table></td><td>වඩාත් උසස් සමාජ තත්ත්වයක් බුක්ති විඳින්නේ අතීත කාන්තාවයි/වර්තමාන කාන්තාවයි මැයෙන් විවාදයක් පවත්වන්න.<br>අතීත ආහාර රටාවෙන් වර්තමානයට ගතහැකි ආදර්ශ මැයෙන් ලිපියක් ලියන්න.<br>වගුගත කරන්න.<table><tr><th>රජු</th><th>සෙල්ලිපිය</th><th>පරිසර සංරක්ෂණ නීතිය</th></tr><tr><td></td><td></td><td></td></tr></table></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>10.7.1 වියළි කලාපයේ පැරණි නගර බිඳවැටීම</td><td>සංචාරක දඩයම් ජීවිතයේ සිට නාගරික ජීවිතය ආරම්භය තෙක් ගලා ආ ගමන සංකල්ප සිතියමකින් දක්වන්න.</td><td>• කෙටි ලිඛිත ප්‍රශ්නාවලියක් සකසන්න.<br>1. පලමු නාගරිකරණයට අයත් නගර 2 මොනවාද?<br>2. වියලි කලාපයේ නගර බිහිවීමට හේතු මොනවාද?<br>3. පැරණි නගර බිඳ වැටීමට හේතු මොනවාද?</td><td>• ප්‍රශ්නාවලි ක්‍රමය<br>• සංකල්ප සිතියම්</td><td>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්<br>• ආකෘති සිතියම්<br>• විවිධ පිංතූර</td><td>ලංකා ඉතිහාසය</td><td>පෙළ පොත ක්‍රියාකාරකම 01</td></tr>
<tr><td>10.7.2 දෙවන නාගරිකරණ සමයේ රටේ ස්ථාවරත්වය ගොඩනගා ගත් පාලකයෝ</td><td>වගු ගත කරන්න.<table><tr><th>රාජධානිය</th><th>පාලකයා</th><th>වැදගත් සේවාවන්</th></tr><tr><td></td><td></td><td></td></tr></table></td><td>පහත රජවරුන්ගේ සේවාවන් අගය කරන්න<br>• II පරාක්‍රමබාහු<br>• IV පරාක්‍රමබාහු<br>• VI පරාක්‍රමබාහු</td><td>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• පිටු පෙරලනයක් සැකසීම<br>• සාකච්ඡා ක්‍රමය</td><td>• ශ්‍රී ලංකා ආකෘති සිතියම් ඇසුරෙන් රාජධානි ලකුණු කිරීම<br>• රාජධානි වලට අදාල ඡායාරූප ගොනුවක්</td><td>මධ්‍යකාලීන ලංකා ඉතිහාසය</td><td>ලංකා සිතියමක රාජධානි සංක්‍රමණය වූ ආකාරය සිතියමක ලකුණු කරන්න</td></tr>
<tr><td>10.7.3 දෙවන නාගරිකරණයේ ආර්ථික රටාව හා ආගම සංස්කෘතිය</td><td>වගු ගත කරන්න.<table><tr><th>ක්ෂේත්‍රය</th><th>පළමු නාගරීකරණය</th><th>දෙවන නාගරීකරණය</th></tr><tr><td></td><td></td><td></td></tr></table></td><td></td><td>• සාකච්ඡා ක්‍රමය</td><td></td><td></td><td></td></tr>
</table>

<table>
<tr><th>අනු ඒකකය</th><th>ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්</th><th>ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න</th><th>ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද</th><th>ඉගෙනුම් ආධාරක</th><th>අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම</th><th>ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම</th></tr>
<tr><td>10.7.4 දෙවන නාගරිකරණ සමයේ සාහිත්‍ය</td><td>• "සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය කෝට්ටේ යුගයයි" පැහැදිලි කරන්න.<br>- පිරිවෙන්<br>- කතුවරු<br>- කෘති ඇසුරරෙන්</td><td>වගු ගත කරන්න.<table><tr><th>කතුවරයා</th><th>යුගය</th><th></th></tr><tr><td></td><td></td><td></td></tr></table></td><td>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණය<br>• ගවේෂණ</td><td>• පෙළ පොත<br>• විවිධ යුගවල රචිත සාහිත්‍ය කෘති</td><td>• ලංකා ඉතිහාසය III කොටස (අධ්‍යාපන ප්‍රකාශන)</td><td>• පුස්තකාලය පරිශීලනයට යොමු කිරීම</td></tr>
<tr><td>10.8.1 මහනුවර රාජධානියේ ආරම්භය හා ව්‍යාප්තිය</td><td>• මහනුවර පාලනයන් අනුපිළිවෙලට පෙළගස්වන්න.</td><td>වගු ගත කරන්න.<table><tr><th>පාලකයා</th><th>දේශපාලන සේවා</th><th>ආර්ථික සේවා</th><th>ආගමික සේවා</th></tr><tr><td></td><td></td><td></td><td></td></tr></table></td><td>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණය<br>• සාකච්ඡා ක්‍රමය<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්</td><td>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්</td><td>• ලංකා ඉතිහාසය (ජා.අ.ආ.)<br>• ඩොයිලි දුටු ලංකාව<br>• රොබට් නොක්ස් ගේ එදා හෙළදිව</td><td>මහනුවර ක්ෂේත්‍ර අධ්‍යාපනික චාරිකාවක් සංවිධානය</td></tr>
<tr><td>10.8.2 මහනුවර පරිපාලන ක්‍රමවේදය</td><td>• මහනුවර පරිපාලන ව්‍යූහ දළ ආකෘතියක් ඇඳ දක්වන්න.</td><td>වගු ගත කරන්න.<table><tr><th>නිලධාරියා</th><th>පැවරෙන කාර්යයන්</th></tr><tr><td></td><td></td></tr></table></td><td></td><td>• පෙළපොත<br>• ගුරු අත්පොත<br>• ඡායාරූප</td><td></td><td></td></tr>
<tr><td>10.8.3 මහනුවර ජන ජීවිතය</td><td>ගුරු අත්පොත 33 පිටුව සංකල්ප සිතියම සම්පූර්ණ කරවීම.</td><td>පෙළ පොත<br>ක්‍රියාකාරකම – 03<br>(පිටුව - 115)</td><td>• සංවාද<br>• සංකල්ප සිතියම්<br>• ප්‍රශ්නාවලි ක්‍රමය</td><td>• පැවරුම් පත්‍රිකා</td><td></td><td></td></tr>
</table>

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 10.9.1 පුනරුදය විමර්ශනය කරයි | • පුනරුද සමයේ<br>- භාෂාව<br>- සාහිත්‍ය<br>- කලාව<br>- විද්‍යාව<br>- වෛද්‍ය විද්‍යාව<br>- දේශපාලනය<br>- ආර්ථිකය යන අංශ ආවරණය වන පරිදි සඟරාවක් සැකසීම. | ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කිරීම.<br>**(i)** පුනරුදය යනු කුමක්ද ?<br>**(ii)** පුනරුදයට බලපෑ හේතු මොනවාද?<br>**(ii)** මානව වාදය යනු කුමක්ද ? ආදී ලෙස | • සංකල්ප සිතියම්<br>• සාකච්ඡා ක්‍රමය<br>• ප්‍රශ්නාවලි ක්‍රමය | • ලෝක සිතියම්<br>• ගුරු අත්පොත<br>• පෙළපොත<br>• පුනරුද සමයට අදාළ පින්තූර | • වීඩියෝපට<br>• පින්තූර<br>• පුනරුදය සම්බන්ධ පොත්පත් | පුනරුදයට සම්බන්ධවැදගත් නගර, රටවල් ආදී ස්ථාන සිතියමක ලකුණු කරන්න. |
| 10.9.2 පුනරුදය ලංකාවට කල බලපෑම | • පුනරුදයේ බලපෑම ලංකාවේ<br>- දේශපාලන<br>- ආර්ථික<br>- සමාජ සංස්කෘතික යනාදි අංශ වෙත බලපෑම් එල්ල කළ ආකාරය පැහැදිලි කරන්න. | 10 ශ්‍රේණිය පෙළ පොත - 125 පිටුව ක්‍රියාකාරකම | | | | |
| 10.10.1 පෘතුගීසීන් ආසියාවට පැමිණීම | • පෘතුගීසින් ආසියාවට පැමිණීම සංකල්ප සිතියමක් ඇසුරෙන් ගොඩනංවන්න. | • යුරෝපීයන් නව වෙළ මාර්ග සෙවීමට යොමුවීමට හේතු :-<br>• දේශ ගවේශණය සඳහා පෘතුගාල රජුගේ දායකත්වය<br>• යුරෝපීයන් ආසියාවට පැමිණීමට හේතු පෙළ ගස්වන්න. | • සංකල්ප සිතියම්<br>• සාකච්ඡා ක්‍රමය | • බ්‍රිස්ටල් බෝඩ්<br>• ප්ලැටිග්නම්<br>• ලෝකසිතියම් | ලංකාවේ පෘතුගීසි පාලනය සම්බන්ධව රචනා වී ඇති පොත්පත් | පෘතුගීසීන් ආසියාවේ බලය ගොඩනඟා ගත් ස්ථාන සිතියමක ලකුණු කරවන්න. |

<table>
<tr><th>අනු ඒකකය</th><th>ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්</th><th>ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න</th><th>ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද</th><th>ඉගෙනුම් ආධාරක</th><th>අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම්</th><th>ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම</th></tr>
<tr><td>10.10.2 පෘතුගීසීන් පැමිණි අවධියේ ලංකාවේ දේශපාලන තත්ත්වය</td><td>වගු ගත කරන්න.<br>පෘතුගීසි බලපෑමට ලක්වූ රජවරු,<table><tr><th>පාලනය</th><th>පෘතුගීසි හා සම්බන්ධ වැදගත් සිදුවීම්</th></tr><tr><td></td><td></td></tr></table></td><td>• පෙළ පොත ක්‍රියාකාරකම 1 හා2 (137 පිටුව)</td><td>• බුද්ධි කලම්භනය<br>• සාකච්ඡා ක්‍රමය<br>• ගවේෂණය</td><td>• ලංකා සිතියම්</td><td>ලංකා ඉතිහාසය IV කොටස (ජා.අ.ආ.)</td><td>පෘතුගීසි බලපෑමට ලක්වූ ලංකාවේ විවිධ ප්‍රදේශ සිතියමක ලකුණු කරවීම.<br>වගු ගත කරන්න.<table><tr><th>වර්ෂය</th><th>සටන</th><th>පෘතුගීසි සෙන්පති</th><th>රජු</th></tr><tr><td></td><td></td><td></td><td></td></tr></table></td></tr>
<tr><td>10.10.3 ශ්‍රී ලංකාව හා ලන්දේසීන්</td><td>පෘතුගීසි පලවා හැරීමට උත්සහා ගැනීමේදී ලන්දේසි සහය පැතූ රජවරු,<table><tr><th>රජු</th><th>ලන්දේසි දූතයා</th><th>අනුගමනය කළ ක්‍රියාමාර්ග</th></tr><tr><td></td><td></td><td></td></tr></table>ලෙස වගු ගත කරන්න.</td><td>• කෙතරම් අභියෝග එල්ල වුවත් ලංකාව තුළ ලන්දේසි උපක්‍රමශීලීව කටයුතු කළ ආකාරය උදා :- 2 ඇසුරෙන් පහදන්න.<br>• ගුරුඅත්පොත පිටුව 39 ස්ථාන ලංකා සිතියමක ලකුණු කරවන්න.</td><td>• සාකච්ඡා ක්‍රමය<br>• ප්‍රශ්නෝත්තර ක්‍රමය<br>• විවාද</td><td>• සිතියම්<br>• $A_4$ කොළ<br>• ගුරු අත්පොත</td><td>ලංකාවේ ලන්දේසි පාලන සමය (ජා.අ.ආ.)</td><td>පෘතුගීසින් පලවා හැරීමට ලන්දේසීන් ගෙන්වා ගැනීම කොතරම් දුරට ප්‍රායෝගික තීරණයක් ද ?<br>මැයෙන් විවාදයක් පැවැත්වීම</td></tr>
</table>